## නිවේදනයයි

**ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා තෝරා පත් කර ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2026**

උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය යටතේ දැනට පුරප්පාඩුව පවතින පහත තනතුරු සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම් ඇති නිලධාරීන්ගෙන් දීප ව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලැබේ.

| | පුරප්පාඩුව පවතින තනතුර | අනුමත ශ්‍රේණිය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | ශ්‍රී ලං.අ.ප.සේ. I | 01 |
| 02 | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (දිඹුලාගල) | ශ්‍රී ලං.අ.ප.සේ. I | 01 |
| 03 | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (ගලෙන්බිදුණුවැව) | ශ්‍රී ලං.අ.ප.සේ. I | 01 |
| 04 | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (කැබිතිගොල්ලෑව) | ශ්‍රී ලං.අ.ප.සේ. I | 01 |
| 05 | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (පොළොන්නරුව) | ශ්‍රී ලං.අ.ප.සේ. I | 01 |

02. සුදුසුකම්

I. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුය.

II. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පූර්වාසන්න වසර 05 තුළ කිසිදු විනයානුකූල දඬුවමකට යටත් නොවූ අයෙකු විය යුතු අතර, කිසිදු ආකාරයක විනය කටයුත්තක් පවතින හෝ එවැනි කටයුත්තකට භාජනය වීමට නියමිත අයෙකු නොවිය යුතුය.

III. අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට පූර්වාසන්න වසර 05 තුළ නියමිත පරිදි සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු අතර, සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබිය යුතුය.

IV. සෑම අයදුම්කරුවකුම තම තනතුරේ සේවය කිරීම ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

V. අයදුම්පත් කැඳවන දිනට තනතුරට පත් කිරීම සඳහා වන අදාළ සියලුම සුදුසුකම් සම්පූර්ණකර තිබිය යුතුය.

03. අයදුම්පත් යොමු කළ යුතු ආකාරය

I. අයදුම්කරුවන් විසින් මේ සමග දක්වා ඇති ආදර්ශ ආකෘතියට (ඇමුණුම 01) අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කරන ලද අයදුම්පත නිසි පරිදි සම්පූර්ණකර, 2026.09.11 වන දින හෝ ඊට පෙර දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ ලේකම් මගින් (උතුරු මැද පළාතේ අයදුම්කරුවන් හැර අනෙකුත් පළාත් සභාවල අයදුම්කරුවන් අදාළ පළාත් අමාත්‍යාංශ ලේකම්ගේ හා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව යොමු කළ යුතු වේ) **"ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය, පළාත් සභා පරිපාලන ගොඩනැගිල්ල, හරිශ්චන්ද්‍ර මාවත, අනුරාධපුරය"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. . (ආදර්ශ අයදුම්පත හා ලකුණු පටිපාටිය **www.cm.nc.gov.lk** ) වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය)

II. එසේම තනතුරු කිහිපයකට ඉල්ලුම් කරනු ලබන්නේ නම්, ආදර්ශ අයදුම්පත්‍රයේ අනු අංක 01 යටතේ ඉල්ලුම් කරන තනතුරු ප්‍රමුඛතාවය අනුපිළිවෙලට සඳහන් කළ යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ තනතුරු සඳහා නිලධාරීන් තෝරා පත් කර ගැනීම" යනුවෙන් සඳහන් කොට තිබිය යුතුය.

III. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාදවීම හෝ නැතිවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් භාරගනු නොලැබේ.

04. තෝරා ගන්නා ක්‍රමවේදය

I. මෙ සමග දක්වා ඇති ඉහත අංක 02 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්පත් උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර , ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත පදනම්ව ලකුණු ලබා දෙනු ලැබේ (ඇමුණුම 02හි සඳහන් ලකුණු පටිපාටිය අනුව). එම ලකුණු මත පදනම්ව ඉහළම ලකුණු ලබාගත් නිලධාරියා/නිලධාරීන් අදාළ තනතුරු සඳහා තෝරා පත් කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

සටහන :සුදුසුකම් සනාථ කරන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් ද අයදුම්පත සමග අමුණා එවිය යුතුය.

II. කෙසේ වෙතත් අයදුම්පත් යොමු කිරීමේ දී අයදුම්කරුවන්ට තම මනාපය පරිදි පුරප්පාඩු තනතුරු නම් කළ හැකි අතර, එම තනතුරුවලට පත් කිරීමේදී එම මනාපයද සළකා බලනු ලැබේ.

05. මෙහිදී තනතුරු කිහිපයකට ඉල්ලුම් කල හැකි නමුත්, පවත්වනු ලබන විධිමත් සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා ලද ලකුණු ද සැලකිල්ලට ගෙන ඉහත තනතුරු සඳහා තේරිපත් වන නිලධාරීන් එම පුරප්පාඩු සඳහා තෝරා පත් කිරීම, ස්ථානගත කිරීම හා පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට අදාළ සියලු කටයුතු සම්බන්ධයෙන් උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

06. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර, කිසියම් අනුකූලතාවයක් පවතී නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

**කේ.එම්.එච්.එස්.කේ.ජයලත්**
ලේකම්
උතුරු මැද පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ, නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන, විශේෂ ව්‍යාපෘති, සංචාරක, ක්‍රීඩා සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
උතුරු මැද පළාත.

2026.08.21